අංක 48.]

(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2024 සැප්තැම්බර් 04 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1922/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වාර්ෂික ෂීට් රබර් නිෂ්පාදනය කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ වාර්ෂික රබර් අපනයන ආදායම කොපමණද;

(v) ඉදිරියේදී අලුතින් රබර් වගාව ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1946/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගෘහස්ථ කම්කරුවන් ලෙස සේවය කරනු ලබන පුද්ගලයන්ගේ තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුව සතුව පවතින්නේද;

(ii) එසේ නම්, මේ වනවිට ශ්‍රී ලංකාවේ සේවය කරනු ලබන ගෘහස්ථ කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1974/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉතාම වේගයෙන් ඛාදනයට ලක් වන වෙරළ කලාප කවරේද;

(ii) ඛාදනයට ලක් වූ වෙරළ කලාප අතරින් මේ වනවිට සංරක්ෂණය කර ඇති වෙරළ කලාප සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට සංරක්ෂණය කරමින් පවතින වෙරළ කලාප කවරේද;

(iv) වර්ෂ 2019 සිට මේ දක්වා වෙරළ සංරක්ෂණ ව්‍යාපෘති වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල කොපමණද;

(v) වෙරළ සංරක්ෂණ ව්‍යාපෘති සඳහා විදේශීය ණය මාර්ගයෙන් සපයා ගන්නා ලද මුදල, ඉහත සඳහන් මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1997/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුදල්, ප්‍රධාන වශයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ අවශ්‍යතා සඳහා වියදම් කිරීමට අදාළ විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා උත්සාහ දරන බවත්;

(ii) ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා එකඟ වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම තත්ත්වය තුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත් කර එම තනතුර සඳහා වෙනත් පුද්ගලයකු පත් කර ගැනීමට කටයුතු කරමින් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2140/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොල්ෆ් ක්‍රීඩාංගන, ගොල්ෆ් රිසෝට්, විලා 600ක්, ජාත්‍යන්තර රෝහලක්, ආයුර්වේද රෝහලක්, තරු පහේ හෝටල් 02ක් සහ උද්භිද උද්‍යානයකින් සමන්විත ඇල්ෆා ඇන්ඩ් ඔමේගා ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගම විසින් බෙරගල ක්‍රියාත්මක කරන Hidden Valley Eco Golf Resort ව්‍යාපෘතියට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමතිය ඇති බවත්;

(ii) ඒ වෙනුවෙන් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සොරගුණේ කුඩා කතරගම දේවාලයේ අක්කර 628ක ඉඩමක් මිලට ගෙන ඇති අතර ඒ සඳහා එවකට සිටි බස්නායක නිලමේවරුන් සහ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ ලිපි සහිත නීත්‍යානුකූල ඔප්පු, පත්ඉරු, පිඹුරුපත් හා දේවාල රාජකාරි සන්නස ඇතුළු ලිපි ලේඛන ඇති බවත්;

(iii) එසේ වුවද, ඉහත ව්‍යාපෘතියට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අනුමතිය සහ ඉහත දේවාලයේ වර්තමාන නිලමේවරයා සහ පෙර නිලමේවරුන් එකඟතාවය ලබා දී නොමැති බැවින් ඉහත ව්‍යාපෘතිය ආරම්භ කිරීම වසර හතක් පමණ ප්‍රමාද වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට ඉහත ව්‍යාපෘතියට ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක් පමණ වැය කර ඇති බැවින් එය කඩිනමින් ආරම්භ කිරීමට අනුමතිය ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 6 සහ 7 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2024 ඔක්තෝබර් 08 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

3\.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ජගත් කුමාර සිසුනැණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

4\.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජුනි 28 දිනැති අංක 2390/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.26 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 18 දිනැති අංක 2393/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 1),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විමසා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 2),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟත්වය ඇතිව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 මැයි 03 දිනැති අංක 2382/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ වෙක් පෝට් සිටි කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 අගෝස්තු 09 දිනැති අංක 2396/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.09.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති,— 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඇ) සහ VI කොටස සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2024 ජූලි 01 දිනැති අංක 2391/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.09.03 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සත්ත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ආගමන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ආරක්ෂණ පියවර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 4),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 5),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නිවේදනය,— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 24 දිනැති අංක 2368/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සම්මතය,— විදේශ විනිමය සංචිත අඛණ්ඩව ක්ෂය වීම හේතුවෙන් ශ්‍රී ලංකාව, 2022 මාර්තු මාසයේදී ණය තිරසර අර්බුදයකට මුහුණපාන ලදින් ඉන් අනතුරුව, ශ්‍රී ලංකා මුදල් මණ්ඩලයේ උපදෙස් මත ආර්ථිකය තවදුරටත් පිරිහීම වැළැක්වීම පිණිස විදේශ රාජ්‍ය ණය ආපසු ගෙවීම ශ්‍රී ලංකාව විසින් අත්හිටවන ලද හෙයින් ද;

ජනතාව වෙත මෙම බරපතල ගැටලුව සම්බන්ධයෙන් විනිවිදභාවයකින් යුතු අනාවරණයක් සිදු කිරීමෙන් අනතුරුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ අර්බුදයට විසඳුමක් සෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදින්, පාර්ශ්වකරුවන්ගේ උපදේශනයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ සිදුකරනු ලබන සාකච්ඡාවන්හිදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීමට මූල්‍ය උපදේශකවරු වශයෙන් ලසාඩ් (Lazard) සහ නීති උපදේශකවරු වශයෙන් ක්ලිෆර්ඩ් චාන්ස් එල්එල්පී (Clifford Chance LLP) පත් කරන ලද හෙයින් ද;

අභියෝග සහ හව්‍ය විසඳුම් පිළිබඳ විග්‍රහ කරමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පුළුල් සමාලෝචනයක් සිදු කළ අතර ණය තිරසරභාවය සම්බන්ධයෙන් තක්සේරුකරණයක් ද නිකුත් කරන ලදින්, ඉන් අනතුරුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මාර්ග සිතියමට අනුව ශ්‍රී ලංකාව විසින් සූක්ෂම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලද හෙයින් ද;

ද්විපාර්ශ්වීය ණය හිමියන් වෙත නැවත ණය ආපසු ගෙවීම් සහ ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් සඳහා සිදු කරන ගෙවීම් ද අන්තර්ගත විදේශ ණය ආපසු ගෙවීම අත්හිටවනු ලැබුවද, ශ්‍රී ලංකාව විසින් බහු පාර්ශ්වීය ණය හිමියන් වෙත ගෙවීම් සිදු කිරීම වෙනුවෙන් කැපවී සිටි හෙයින් ද;

2023 ජුනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, පාර්ලිමේන්තුව, රාජ්‍ය ණය තිරසරභාවය සහතික කරනු පිණිස ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය ප්‍රශස්ත කිරීමට තීරණය කරන ලද හෙයින් ද;

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසරභාවය පිළිබඳ තක්සේරුකරණයට අනුකූලව ශ්‍රී ලංකාව විසින් දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කරන ලදින්, ඉන් අනතුරුව, විදේශ ණයවල ඉතිරි කොටස් ද්විත්වය ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන් සහ ස්වෛරී බැඳුම්කර හිමියන් වෙත සිදු කළ යුතු ගෙවීම්වලින් සමන්විත වන හෙයින් ද;

ප්‍රංශය, ජපානය සහ ඉන්දියාවේ නායකත්වයෙන් යුතුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසරභාවය පිළිබඳ පරාමිතීන්ට අනුව ද්විපාර්ශ්වීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම උදෙසා නිල ණය හිමියන්ගේ කමිටුවක් (OCC) ස්ථාපිත කරන ලදින්, ශ්‍රී ලංකාව ඊට සමගාමීව, නිල ණය හිමියන්ගේ කමිටුව මෙන්ම එම පරාමිතීන් යටතේ චීන අපනයන හා ආනයන බැංකුව (EXIM Bank) සමඟ සාකච්ඡාවන්හි නිරත වූ හෙයින් ද;

අනාගත ධනාත්මක ණය සමාලෝචන සඳහා මඟ සලසමින් ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීන අපනයන හා ආනයන බැංකුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පැවති සාකච්ඡා සාර්ථකව අවසන් කිරීම පිළිබඳ සඳහන් කරමින් 2024 ජූනි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ හෙයින් ද;

ශ්‍රී ලංකාව, මෙම ක්‍රමෝපායික සහ මිනිත ප්‍රවේශය හේතුවෙන් වැඩි දියුණු කරන ලද ණය ශ්‍රේණිගත කිරීමට එළැඹීම අපේක්ෂා කරනු ලබන අතර එමඟින් ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට පහසුකම් සලසනු ලබන හෙයින් ද;

ශ්‍රී ලංකා රජය විසින් සාර්ථකව පවත්වන ලද සාකච්ඡා මාලාවකින් අනතුරුව, කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකා රජය සහ නිල ණය හිමියන්ගේ කමිටුව ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් අවසන් ගිවිසුමකට පැරිසියේදී එළැඹි අතර ශ්‍රී ලංකා රජය සහ චීන අපනයන හා ආනයන බැංකුව ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් අවසන් ගිවිසුමකට බීජිංහිදී එළැඹෙන ලදින්, නව බැඳියාවක් සමඟින් ණය හිමි රටවල් සමඟ ද්විපාර්ශ්වීය ආර්ථික සබඳතා නැවත ආරම්භ කිරීමට ශ්‍රී ලංකාව වෙත මෙම ගිවිසුම් මඟ සලසනු ලබන හෙයින් ද;

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසරභාවය පිළිබඳ විශ්ලේෂණයට අනුව ණය තිරසරභාවය නැවත අත් කර ගැනීම සඳහා උපකාරී වන ලදින්, තවද වේගවත් ආර්ථික ප්‍රකෘතියකට පහසුකම් සලසමින්ද, තිරසර වර්ධනයක් ඇති කරලමින්ද ශ්‍රී ලංකාවේ ආර්ථිකය සුවිශේෂී අයුරින් පරිවර්තනය කිරීම සඳහා එකී ගිවිසුම් සුදානම් වන හෙයින්; සහ

2024 ජූනි 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පහත ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලුම අවසර මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙත ලබා දීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ නිල ණය හිමියන්ගේ කමිටුව (OCC) අතර 2024 ජූනි 26 වැනි දින එළඹෙන ලද අවසන් ගිවිසුම; සහ

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන අපනයන හා ආනයන බැංකුව (EXIM Bank) අතර 2024 ජූනි 26 වැනි දින එළඹෙන ලද අවසන් ණය ගිවිසුම් සංශෝධන කිරීමේ ගිවිසුම.

*29.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජූනි 18 දිනැති අංක 2389/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග,— 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11 වගන්තිය සමඟ කියවිය යුතු 17 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 30 දිනැති අංක 2382/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 වන අධිකාරය වූ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47(1) වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 මැයි 25 දින සාදනු ලදුව, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*33.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග,— (81 අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වගන්තිය සමඟ කියවිය යුතු 6 සහ 10 වගන්ති යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 28 දිනැති අංක 2364/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*35.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 19(2) වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 15 දිනැති අංක 2393/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

36.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

37.

සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

38.

ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

39.

පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

40.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

46.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

47.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

48\.
මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

49\.
ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

50\.
විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

51\.
විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

52\.
වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

53\.
අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

54\.
හෙක්ටර් අප්පුහාමි හෙල්පින් හැන්ඩ් පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

55\.
ජනරාජ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

56\.
වන්නි මන් පුණ්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

2160/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර අධ්‍යාපන කලාපයේ දෙමළ මාධ්‍ය පාසල් අතරින් 1 සී වර්ගීකරණය යටතේ වර්ග කර ඇති පාසල්වල නම් කවරේද;

(ii) ඉහත පාසල් අතරින් විදුහල්පතිවරුන් සහ උප විදුහල්පතිවරුන් නොමැති පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිවරුන් බඳවා ගැනීම සඳහා පැවති විභාගයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට පත්වීම් ලබා දීමේදී, කළුතර අධ්‍යාපන කලාපයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් කිහිපයකට උප විදුහල්පති පත්වීම් එකකට වඩා ලබා දී ඇති බවත්;

(ii) උප විදුහල්පතිවරයකු නොමැති මග්ගොන, අල් හසනියා මහා විද්‍යාලයට මේ දක්වා උප විදුහල්පතිවරයකු පත් කර නොමැති බවත්;

(iii) ඉහත පාසලේ ගණිතය, ඉංග්‍රීසි, සෞඛ්‍ය, ඉතිහාසය, තොරතුරු තාක්ෂණවේදය යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු සහ ප්‍රාථමික ගුරු පුරප්පාඩු පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත විද්‍යාලයේ පවතින උප විදුහල්පති පුරප්පාඩුව සහ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?